# Brilliant Minds

# Multiple Intelligence challenge 2022


ඩිජිටල් අධ්‍යාපන හා වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## <u>තරඟ ස්වභාවය හා කොන්දේසි</u>

1. මූලික සුදුසුකම්
   මෙම තරඟය මානව ශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ සියලුම අභ්‍යන්තර සිසුන් සඳහා විවෘතය.

2. ලියාපදිංචි කිරීම
   සිසුන් ලියාපදිංචි කිරීම කාණ්ඩ කිහිපයක් යටතේ සිදු කෙරේ.

   මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ,

   1. ප්‍රථම වසර සියලුම විද්‍යාර්ථීන්
   2. සාමාන්‍ය උපාධි පාඨමාලාව යටතේ ලියාපදංචි වී සිටින දෙවන (02) සහ තෙවන (03) වසරවල සියලුම විද්‍යාර්ථීන්
   3. විශේෂවේදි උපාධි පාඨමාලාව යටතේ ලියාපදංචි වී සිටින දෙවන (02), තෙවන (03) සහ සිව්වන (04) වසරවල සියලුම විද්‍යාර්ථීන්

   වශයෙන් කාණ්ඩ තුනක් යටතේ වෙන් වෙන් ව ලියාපදංචි විය යුතු ය.

3. තරඟය පවත්වන ආකාරය:

   - පළමු වටය
     ඉහත එක් එක් කාණ්ඩයේ අයදුම්කරුවන්ට සාමාන්‍ය දැනුම සහ යෝග්‍යතාව පිළිබඳ පැයක මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ප්‍රශ්න පත්‍රයක් ලබා දෙනු ලැබේ. පළමු වටයෙන් කණ්ඩායම් 18ක් තෝරාගනු ලබන අතර ඒ සඳහා සෑම කණ්ඩායමකින්ම 50 ක කඩඉම් ලකුණ සපුරාලන සිසුන් ඇතුළත් වේ.

   - දෙවන වටය
     පළමු වටයෙන් තෝරා ගන්නා සියලුම සිසුන්ට පැයක මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ප්‍රශ්න පත්‍රයක් ලබා දෙනු ලැබේ. අවසන් වටය සඳහා හොඳම කණ්ඩායම් අට (08) මුළු ලකුණු මත පදනම්ව තෝරා ගනු ලැබේ. මෙම වටය සඳහා සිසුන් තෝරාගනු ලබන්නේ කඩඉම් ලකුණු 65 මත පදනම්වය.

   - තෙවන වටය
     හොඳම කණ්ඩායම් අටට (08) පැයක මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ප්‍රශ්න පත්‍රයක් ලබා දෙනු ලැබේ.

3.1. ජයග්‍රාහකයින් තෝරා ගැනීම

- පළමු අංශය :
  කේවල තේරීම - අවසන් වටයේ දී පුද්ගලයන් ලබා ගන්නා ඉහළම ලකුණු මත පදනම්ව පළමු, දෙවන සහ තෙවන ස්ථාන තෝරා ගනු ලැබේ.

- දෙවන අංශය:
  අධ්‍යයනාංශ තේරීම - අවසාන වටය සඳහා තෝරාගත් මුළු සිසුන් සංඛ්‍යාව මත පදනම්ව හොඳම දෙපාර්තමේන්තු තුන (03) තෝරා ගනු ලැබේ.

4. ත්‍යාග සහ සහතිකපත්

- අවසන් වටයට තේරී පත්වන සියලුම තරඟකරුවන්ට සහතිකපත් ප්‍රදානය කෙරේ.
- මුදල් ත්‍යාග
  - ප්‍රථම ස්ථානය - රු. 50,000.00
  - දෙවන ස්ථානය - රු. 30,000.00
  - තෙවන ස්ථානය - රු. 20,000.00
- අවසන් වටයයන් ජය ගන්නා හොඳම අධ්‍යයනාංශ කණ්ඩායම් තුන සඳහා කුසලාන පිරිනැමේ.